


සංවාද 1 - "ඇත්තටම මේක ලාභ ගන්න කරන වැඩක් නෙවෙයි මචං. මෙහේ ඉන්න අපේම මිනිස-"සුන්ගෙ අපේ දරුවන්ගේ ඇඟේ තියෙන කලාව එළියට ගන්න කරන වැඩක්. නැත්තං බත් පැකට් එකක් දීලා මේවගේ හෝල් එකක ඩොලර් විසි පහකට ෂෝ එකක් පෙන්නන්න පුලුවන්ද.? ඇත්තටම මේක හොඳ වැඩක්. සමහර නාට්‍යවලින් ලංකාව ගැන වගේම, එහෙ වෙන්නෙ මොකක්ද කියල නොදන්න මිනිස්සුන්ට ලංකාව ගැන දැනගන්නත් මේ නාට්‍යවලින් පුලුවන්. පොඩි ළමයින්ටත් නාට්‍යයක් දෙකක් හැදුවනම් තවත් ප්‍රේක්ෂකයො ටිකක් ගෙන්න ගන්න පුලුවන්. වැඩේ හොඳයි ඔහොම යං.

සංවාද 2 - "හැබැයි කෙටි නාට්‍යය අටක් වැඩියි කියලයි මට හිතෙන්නේ. එහෙම අටක් පෙන්නනවනම් හැම නාට්‍යයක්ම කෙටි විය යුතුයි. මොන මිනිහද කැමති පැය පහක් හයක් හෝල් එකක් ඇතුළේ ඉන්න. ෂෝට් ඇන්ඩ් ස්වීට් නං හැම දෙයක්ම ඒ විදියට වෙන්න ඕනේ. කාලය ගන්නවා කියන්නේ හෝල් එක ටික ටික හිස-"වෙනවා කියන එකයි. රෑ එකොළහ දොළහ වෙන-කංනම් ඉන්න බැහැ. මේ නාට්‍යය ඉවර උනාම අපිත් ගෙදර යනවා. පොඩි එකා අම්ම ළඟ තියල ආවේ. "

සංවාද 3 - "ඇත්තටම මෙහේ දක්ෂ නළු නිළියෝ රාශියක් ඉන්නවා. හරියට පුරුදු කරලා ගත්තොත් ලංකාවේ වෘත්තීය නළු නිළියන් මට්ටමටම ගේන්න පුලුවන්. අර අසවල් නාට්‍යයේ රඟපාපු නිළිය, අර අනෙක් නාට්‍යයෙ රඟපාපු නළුවා ටොප් මචං. ඒවගේම හොඳ නාට්‍යය අධ්‍යක්ෂවරු මෙහෙ ඉන්නවා. හරියට කර ගත්තොත් ලංකාවේ රාජ්‍ය නාට්‍ය උළෙලට උනත් තියන්න පුලුවන් කෙටි නාට්‍ය මේ අතර තියෙනවා. මේකට හරි අනුග්‍රහයක් දෙන්න පුලුවන් ක්‍රමයක් හදා ගත්තොත් තවත් ඉදිරියට ගෙනියන්න පුලුවන්. වැඩේ හොඳයි. මෙහෙ ඉන්න අපිට අලුත් වෙනස-ක්නෙ."

සංවාද 4 - "මේ සැරේ ලයිට් සෙට්අප් ටිකක් අප්සට් මචන්. ගිය සැරේට වැඩිය අප්සෙට්. ස්පොට් ලයිට් වල නෙවෙයි නළු නිළියො හිටියෙ. සමහර තැන්වල හරි අඳුරුයි. නළු නිළියො වෙන තැනක. ස්පොට් ලයිට් හඳ පායලා වගේ වේදිකාවේ මැද නිකං දිලිසෙනවා. සමහර හෝල්වලනම් ස්පොට් ලයිට්, නළු නිළියෝ ඉන්න තැනකට වෙනස් කරන්න පුලුවන්. ඒකෙන් සමහර නාට්‍යවලට හරිහමන් සාධාරණයක් ඉෂ්ඨ උනේ නැහැ කියලයි මට හිතෙන්නෙ. එහෙම බැරි නං තව ස්පොට් ලයිට් දෙකක්වත් ඉස්සරහින් සෙට්අප් කරලා තිබ්බනං හොඳයි. අනෙක මචං අර එක කොනක පළවෙනි නාට්‍යයට සෙට් කරපු සංගීත භාණ්ඩ, ස්වර ප්‍රස්ථාර පුවරු ඇයි අයින් කළේ නැත්තේ. ඒකෙන් අර සමහර නළුවො බිම වැතිරිලා කරපු රඟපෑම් කොනේ හිටපු අපිට හරියට පෙනුන්නෑ. ඒ මදිවට මැද මයික් දෙකක් හිටෝලා. විනාඩි පහක් දහයක් වෙන්කරලා ඒ ටික අයින් කරගන්න තිබ්බේ. එතනදි වෙන්නෙ ප්‍රේක්ෂකයට අසාධාරණයක්."

සංවාදය 5 - "අර පරණ නාට්‍යය සිංදුවලට මියුසික් කරපු පොඩි එවුන් ටික කවුද බං. උන් ටිකට හොඳ අනාගතයක් තියෙනවා. මට බැරිද උන්ගෙ කන්ටැක් නම්බර්ස් ටික ඉල්ලල දෙන්න. මගේ සිංදුවක් තියෙනව කරගන්න. කොල්ලො ටික බිසි නිසා මං කතා කරන්න ගියෙ නැහැ. කොල්ලො ටික නං ප්‍රොපෂනල්. උන් ටිකට පුලුවන් මෙහෙ හොඳ වැඩක් කරන්න."

සංවාද 6 - "මේ සැරේ බත් එක රසයි මචන්. ඒ වගේම මැදදි දුන්න එක හොඳයි. ගිය සැරේ දුන්නේ ඔක්කොම ඉවර වෙලානේ. ගිය පාර අපි අන්තිම නාට්‍යය ටික බැලුවෙ බඩගින්නේ. අනෙක බත් එකක් දෙන නිසා පැයක්වත් විවේකයක් දෙන්න ඕනේ. පැය හයක් විතර නාට්‍ය බලනකොට පැය බාගෙ මදි බං."

"මගේ අම්මෝ පැයක්. පැයක් දෙන්නේ පැය අටක් වැඩ කරන රස්සාවක්නංනේ. උඹ නාට්‍ය බලන්නද ආවෙ නැත්තං ආණ්ඩුවෙ කන්තෝරුවක රස්සාවකටද? එහෙමත් නැත්නං ආවේ නාට්‍යවල රස විඳින්නද නැත්තං බත්වල රස විඳින්නද.?" ඔහු අසල සිටි අනෙක් මිතුරා එසේ අසන හැටි මම බලා සිටියෙමි. ඔහු සිනාසී බත් එක මැද ඇති බිත්තරය කටේ දමා ගත්තේය.

සංවාද 7 - "පොඩි උන් අඬනවා. කෑගහනවා. මොබයිල් පෝන් රින් වෙනවා. ඒ අස්සෙන් දොරවල් ඇර ඇර කට්ටිය ඇතුළට ගන්නවා. සමහරු ටොයිලට් යනවා. එනවා. එහෙම වෙනකොට නාට්‍යයක් රස විඳින්න අමාරුයි. සමහර නාට්‍යවල ඩයලොග් ඇහුන්නෑ. මුල ඉඳන්ම ඒව පාලනය කරගන්න ක්‍රමයක් හදාගන්න ඕනෙ. පොඩි එවුන් එක්කං ආවට කමක් නැහැ. ඒ පැටව් ටික එළියෙ කොහෙ හරි තැනක තියල ෂෝ එක ඉවර වෙනකං ඩේ කෙයා වගේ කවුරු හරි බලාගන්න කෙනෙක් තිබ්බ නං හොඳයි කියල මට හිතෙන්නෙ."

සංවාද 8 - "මේ පාර හුඟක් හොඳයි. නළු නිළියන්ගේ, පිටපත්වල එහෙම ලොකු දියුණුවක් තියෙනවා. හැබැයි මට නාට්‍යය එකක් දෙකක් ඇල්ලුවේ නැහැ. එහෙම නාට්‍ය කරන්න ගියාම හැමෝම සවුත්තු වෙනවා. මං එක ෂෝ එකක් හැර අනික් හැම එකක්ම බැලුවා. එන්න එන්න ලොකු දියුණුවක් තියෙනවා. හැබැයි හදාගන්න ඕන තැනුත් තියෙනවා. ඒ ගැන හොඳට කල්පනා කළොත් මේක හොඳට දියුණු කරගන්න පුලුවන්." ප්‍රේක්ෂකයා එය පැවසුවේ මටය. නාට්‍ය උත්සවයේ මාද කොටස් කරුවකු වෙන නිසා නිහඬවීම හැර වෙන කළ යුතු දෙයක් නොමැති තැන මම සිනහවකින් පිළිතුරු දුන්නෙමි. අනෙක ඔහුට ඇල්ලුවේ නැති නාට්‍ය මගේ නාට්‍යය විය හැකිය.

සංවාද 9 - "මෙච්චර මහන්සි වෙලා මේ මිනිස්සු කරපු වැඩේ අන්තිම වෙනකන් බලන්න ඉන්න බැරි එක අසාධාරණයි. සමහරු බත්එක කාලා ගෙදර ගියා. ඒක නිකන් මහන්සිය වතුරේ ගියා වගේ වැඩක්." කෙනෙකු තම මිතුරා සමග එසේ පවසන විට ඔහු කීවේ "ඒක හරියට සංවිධානය කරගන්න ඕනේ. නාට්‍ය බලන්න හරි බත් ටිකක් කන්න හරි එන මිනිසුන්ගේ කාලය නොකා හරියට සංවිධානය කළානම් එහෙම වෙන්නේ නැහැ. අර අන්තිමට සම්මාන දෙන්න ගත්තු කාලය වැඩීය කියලයි මට හිතෙන්නේ. මොකද මචන් මිනිස්සුන්ට දෙයක් එපා වෙන්න කාලයත් බලපානවා."

ඉහත මා සංවාද ඇසුරෙන් ලියා තැබුවේ මෙවර සිඩ්නි කෙටි නාට්‍ය උළෙල පිළිබඳව ප්‍රේක්ෂක ඇසින් මට ඇසුණු මා දුටු දේය. ලිවීම සාධාරණ නැත. එයට හේතුව මේ නාට්‍ය උළෙලේ එක් නාට්‍යයක් මගේ අධ්‍යක්ෂණයක් හා පිටපතක් බැවිනි. එසේම සියල්ලන්ම එකසේ සතුටුවන තැනක් ලොව කොතැනකවත් නොමැති හෙයිනි.

මෙවර නාට්‍ය උළෙල වෙනුවෙන් නාට්‍ය අටක් රඟ ගත කෙරිණි.
ඒ නිමල් වනිගසිංහගේ නෝක්කාඩුව, අනුර හොරේෂස්ගේ පිටපතකට ප්‍රේමතිලක රණසිංහ අධ්‍යක්ෂණය කළ ප්‍රේමය නම්, දිනේශ් පෙරේරාගේ මට වෛර කරන මම, නිහාල් රූපසිංහගේ කසාදය ඉවර නැහැ, සමඟ වික්ටර් චාග්, සිසිල් ෆොන්සේකාගේ ජාත්‍යන්තර කොස්ගස, හශාන් ප්‍රේමතිලක භාෂිත හෙට්ටිගොඩ එක්ව නිර්මාණය කළ තාරුකා, ලක්ෂ්මන් කොඩිතුවක්කුගේ ප්‍රේමයට මාංචුවක් නැමැති කෙටි නාට්‍යය අටයි. ඒ සියලු නිර්මාණකරුවන්ට, නළු නිළියන්, සංවිධායකයින්, කාර්මික ශිල්පීන් ඇතුලු මෙම උළෙල ඉදිරියට රැගෙන යන්නට අතහිත දෙන ප්‍රේක්ෂක සැම මෙහි කොටස් කරුවන්ය. එසේම හරිහමන් විච-ාරයක් නොමැති තැන මතුවන්නේ අවිච-ාරයයි. එහෙයින් අපේම බුද්ධිමත් ප්‍රේක්ෂක ප්‍රතිචාරය මැදින් මෙම උළෙල සාර්ථකව ඉදිරියට රැගෙන යාම අපට තව යා යුතු දුර බොහෝය. මා ඒ සියල්ල ලියන්නේ අහිතකින් නොවේ. විප්‍රවාසී ගුණාත්මක නාට්‍ය කලාවේ ප්‍රවර්ධනය වෙනුවෙනි. නාට්‍ය උළෙල පිළිබඳව එකිනෙකාගේ අදහස් විවිධය. ඒ පිළිබඳව තව බොහෝ දෑ ඇසුනද සියල්ල




# සිඩ්නි කෙටි නාට්‍ය උළෙල 2017

---

## 16 වන පිටෙන්

මෙහි පාදයක් පිළිවෙලින් 'ත ගණ' එකක් ද 'බ ගණ' එකක් ද 'ද ගණ' දෙකක් ද සහ අවසා-නයේ ගුරු දෙකකින් ද සමන්විත වේ. ගාථා නමයම මේ ආකාරයට ගණ පිහිටුවා පද බැඳ ඇත. මෙහි පාදයක මාත්‍රා ප්‍රස්ථාරය සහ ගණ පිහිටුවා ඇති අයුරු පහතින් දැක්වේ.




මෙලෙස ගණ ඡන්දසට අනුව කවි පබැඳීම මාත්‍රා ඡන්දසට අනුව කවි පබැඳුමට වඩා තරමක් සංකීර්ණ බව පෙනේ. මෙයට මූලික හේතුව වන්නේ ගණ ඡන්දසට අනුව කවි පබැඳීමට සාපේක්ෂ වශයෙන් ගැඹුරු වූ ශාස්ත්‍රීය පදනමක් අවශ්‍ය වීමය. එසේම පැනවී ඇති සීමාවන් ද බහුල වේ. එනිසා මනා සං-යමයකින් යුතුව බස හැසිර වීමට උගත යුතුය. කරුණු කෙසේ වුවද ගණ ඡන්දසට අනුව බිහි වුණ ඉතාමත් අලංකාර වෘත්ත රාශියක් සිංහල සඳැස් කවිය සතුව ඇත.

**මතු සම්බන්ධයි**